# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 55 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

**2009 අංක 55 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 45/2006.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2009 අංක 55 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනතට 2අ, 2ආ 2ඇ සහ 2ඈ යන අළුත් වගන්ති ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්ති ඇතුළත් කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම වගන්ති, එකී පනතේ 2අ, 2ආ, 2ඇ සහ 2ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"වලංගු කිරීම.

2අ. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ අනුමත අර්ථසාධක අරමුදලට 1996 පෙබරවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් අවසන් වන කාලය ඇතුළත සේවා යෝජකයකු හෝ සේවා නියුක්තයකු විසින් දායක මුදල් ගෙවා ඇති අවස්ථාවක එම දායක මුදල් වලංගු ලෙස අඩු කරගෙන ඇති බවට හෝ වලංගු ලෙස අරමුදලට දායක වී හෝ ගෙවා ඇති බවට සලකනු ලැබිය යුතු ය.

වඩාත් ඵලදායී අධි විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා අනුමැතිය.

2ආ. (1) යෝජිත විශ්‍රාම වැටුප් අරමුදල හෝ යෝජනා ක්‍රමය මගින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියම කර ඇති නියමයන් සපුරාලන බවට කම්කරු කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදලට වඩා වාසිදායක වන්නා වූ සේවා යෝජකයා සහ සේවා නියුක්තයන් අතර, එකඟ විය හැකි විශ්‍රාම වැටුප් අරමුදලකින් හෝ යෝජනා ක්‍රමයකින් අධි ප්‍රතිලාභ ලැබීමට (මෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ දී හෝ එදිනට පසුව යම් ආවරණ සේවා නියුක්තියක සේවකයකු වන යම් තැනැත්තකුට

හිමිකම් ඇත්තේ ය. එවැනි අවස්ථාවක දී එම අරමුදල හෝ යෝජනා ක්‍රමය පිළිවෙලින් අනුමත දායක මුදල් ගෙවීමේ විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් බවට කම්කරු කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(2) අදාළ දිනයේ සිට බලපවත්වන පරිදි, අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් අනුමත දායක මුදල් ගෙවීමේ විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් බවට (1) වන උපවගන්තිය ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කරන අවස්ථාවක, එම අරමුදලට හෝ යෝජනා ක්‍රමයට ගෙවිය යුතු සහ ගෙවන ලද සියලු දායක මුදල් වලංගු ලෙස ගෙවා ඇති බවට සලකනු ලැබිය යුතු ය.

සැක දුරු කිරීම.

2ඇ. (1) 1996 පෙබරවාරි මස 01 වන දිනට පසුව යම් කාලයක් ඇතුළත අධි විශ්‍රාමික ප්‍රතිලාභ ලබා දීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් නැතහොත් 2 අ වගන්තියේ සඳහන් කාලයට අදාළව යම් සේවා යෝජකයකු හෝ සේවා නියුක්තයකු සම්බන්ධයෙන් 2 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු බවට සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(2) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හැර, වෙනත් විශ්‍රාම අර්ථසාධක අරමුදලකට, විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ වෙනත් යම් අධි විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට සේවා නියුක්තයකු සාමාජිකයකු වී හෝ දායක මුදල් ගෙවා ඇති අවස්ථාවක එම සාමාජිකත්වය සහ මුදල් ගෙවීම, අවස්ථාවෝචිත පරිදි එකී සේවා නියුක්තයා සාමාජිකයකු බවට පත් වූ දින සිට හෝ දායක මුදල් ගෙවූ දින සිට වලංගු ලෙස ගෙවා ඇති බවට සලකනු ලැබිය යුතු ය.

අනුමත යම් අර්ථසාධක අරමුදල් ආදියට දායක වීම පවත්වාගෙන යාම.

2ඈ. මේ පනත ක්‍රියාත්මක වන දින හා ඊට පසු දිනයේ සිට—

(අ) මේ පනත ආරම්භ වීමට පෙරාතුව 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත

යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල හැර යම් අනුමත අර්ථ සාධක අරමුදලකට, විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ වෙනත් යම් අධි විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා දායක මුදල් ගෙවා ඇති සේවා යෝජකයකු හෝ සේවා නියුක්තයකු සඳහා ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට අඛන්ඩව දායක මුදල් ගෙවීම සහ පවත්වාගෙන යාම; සහ

(ආ) මේ පනත ආරම්භ වීමෙන් පසු 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල හැර වෙනත් අනුමත අර්ථ සාධක අරමුදලකට හෝ වෙනත් යම් අධි විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට යම් සේවා යෝජකයකු හෝ සේවානියුක්තයකු දායක මුදල් ගෙවීම,

නීත්‍යානුකූල බවට සැක දුරු කිරීමේ කාර්යය සඳහා තව දුරටත් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය "මාස හයක් නොඉක්මවන හෝ රුපියල් දහසක දඩයක් නොඉක්මවන" යන වචන වෙනුවට "මාස දොළහක් නොඉක්මවන හෝ රුපියල් දස දහසක දඩයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.